# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2288/22 - 2022 ජූලි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

16 වන වගන්තිය යටතේ වූ ඇඳිරි නීති නියමය

මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය යයි මා විසින් සලකනු ලබන හෙයින්, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිතුමා විසින් කරන ලද පත් කිරීමට අනුව, රනිල් වික්‍රමසිංහ වන මම, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය හෝ ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හෝ පොලිස්පති හෝ ඔවුන් විසින් බලය දෙනු ලබන කවර හෝ නිලධාරියකු විසින් ප්‍රදානය කරන ලද ලිඛිත අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස, 2022 ජූලි මස 14 වන දින පැය 12.00 සිට 2022 ජූලි මස 15 වන දින පැය 05.00 දක්වා කිසිම තැනැත්තකු විසින් යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු උද්‍යානයක, පොදු ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක හෝ එම ප්‍රදේශවල මුහුදු වෙරළේ නොසිටිය යුතු යයි මේ නියමය මගින් විධාන කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
අග්‍රාමාත්‍ය,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37(1) ව්‍යවස්ථාව ප්‍රකාරව
ජනාධිපතිතුමා විසින් කරන ලද පත්කිරීමට අනුව.

2022 ජූලි මස 14 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය

EOG 7 - 0068

1A - G 37073 — 08 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*